# ධර්මය සහ යථාර්ථය 3

**අන්ධයන් සේ මිථ්‍යාව පසුපස දුවන බෞද්ධයන්ටයි.**

## ආචාර්ය වල්පොළ රාහුල හිමි

*ආගම් ඇදහීමේදී වර්තමාන ශ්‍රී ලංකාවේ බැතිමතුන් ප්‍රතිපත්ති පූජාවට ලැබෙන වැදගත්කම යටපත් කොට ආමිස පූජාවට ප්‍රමුඛ වැදගත්කමක් ලබාදී තිබෙන බව දැකිය හැකිය. ඒ අළලා මීට දශක කිහිපයකට ඉහතදී ආචාර්ය වල්පොළ රාහුල හිමියන් පළ කළ අදහස් කොටස් වශයෙන් පළකරනු ලබන්නේ ඒ අදහස් එදාට වඩා අදට වලංගුයැ'යි පෙනෙන නිසාය. මෙම ලිපි පෙළ ධර්මය ගැන උනන්දුවක් දක්වන්නන්ගේ අවධානයට යොමු කරන ලෙස අපි පාඨකයන්ගෙන් ඉල්ලා සිටිමු.*

*අනුග්‍රහය රාවය*



# පින්කම් හා ප්‍රාර්ථනා

**තමාට පින් බලාපොරොත්තුවෙන් යමක් කිරීම සම්පූර්ණ පිරිසිඳු අදහසක් නොවන බවත්, ප්‍රාර්ථනා කිරීම අන්තිම වශයෙන් නිවන් ප්‍රාර්ථනා කිරීම පවා බෞද්ධ අදහසක් නොවන බවත් ඔබ කියන්නෙහිය. මෙය මට තේරුම් ගත් නොහැක. කරුණාකර ඔබගේ අදහස පහදා දෙන්නෙහිද ?**

ඔව්, මම එය තෝරා දෙන්නට වෑයම් කරමි. එහෙත් එය වචනයකින් දෙකකින් කළ හැක්කක් නොවේ. සත්‍යය සෙවීමේ අභිලාෂයෙන්, කිසිත් බැඳීමක් නැතිව, නිදහස්ව සාකච්ඡා කිරීමෙන් පසු නුවණින් සිතා බැලූවිට එය වැටහෙනවා ඇත. පොතපතින් හෝ ගුරු මුඛයෙන් උගත් දේ පමණක් සත්‍යයයි සිතාගෙන කලින්ම සත්‍යයට සීමාවක් තබාගත් පුද්ගලයකුට කවදාවත් සත්‍යය අවබෝධ කළ නොහැක. එනිසා කිසිවකටත් වහල් නොවී නිදහස්ව සිතන්නට පුරුදු විය යුතුයි.

තමාට, පින් බලාපොරොත්තුවෙන් යමක් කිරීම සම්පූර්ණ පිරිසිදු අදහසක් නොවන බවත්, ප්‍රාර්ථනා කිරීම, අන්තිම වශයෙන් නිවන් ප්‍රාර්ථනා කිරීම පවා බෞද්ධ අදහසක් නොවන බවත් මම තෝරා දෙන්නම්. ඒ ගැන අපි මුල පටන්ම කතා කරමු.

**මිනිස්සු නොඑක් අන්දමේ වෙළඳම් කරති. හාල් සිල්ලර, ඇඳුම් පැළඳුම්, ආහාරපාන වර්ග සහ මහජනයාට වුවමනා වෙනත් නොඑක් දේ ජාතිභේද, කුලභේදාදී කිසිත් නොසලකා හැම දෙනාටම විකුණති. මේ ක්‍රියාවට 'පින්කමය' නොකියන්නේ ඇයි ?**

එය තමන්ට ලාභයක්, ප්‍රයෝජනයක් බලාපොරොත්තුවෙන් කරන වැඩක් නිසයි.

**හරි, ඒ අදහස කවුරුත් කිසි විරුද්ධයක් නැතිව පිළිගනිති. එසේම යමෙක්, වෙළඳමෙන් වාගේ මුදලින්ම නුවූවත්, අන් අයුරකින් මෙළොවදී ලාභයක්, කීර්තියක් ප්‍රශංසාවක් බලාපොරොත්තුවෙන් අසරණයකුට උදව්වක් කරන්නේ යැයි සිතමු. එය පිරිසිඳු අදහසක් යැයි ඔබ පිළිගන්නෙහිද ?**

සැබැවින්ම නැත. එය පිරිසිදු අදහසක් නොවේ. එය තමන්ට මෙලොවදී යමක් බලාපොරොත්තුවෙන් කරන වැඩකි. එයත් වෙළඳමක් සමානයි.

**හොඳයි, යමෙක් පරලොව සැප බලාපොරොත්තුවෙන් අසරණයකුට උදව්වක් කරන්නේ යැයි සිතමු. ඒ ගැන ඔබගේ අදහස කුමක්ද ? එහි වරදක් මට නොතේරේ. කවුරුන් වුවත් පින් දහම් කරන්නේ පරලොව පිණිස නොවෙයිද ?**

එහෙත් එයද පිරිසිදු අදහසක් නොවේ. මෙලොව වුවත් පරලොව වුවත් ඒ බලාපොරොත්තුව ආත්මාශාවයි. මෙලොව දී බලාපොරොත්තුවීමට වඩා පරළොව දී බලාපොරොත්තු වීමේ ඇති වෙනස නම් ස්වල්පයක් කල්දැමීම පමණකි. ධනවත්තු බැංකුවේ මුදල් තැන්පත් කොට, වර්ෂයක් දෙකක් පසුවී පොලී සමග විශාල මුදලක් ගන්නට බැංකුවේ මුදල් තැන්පත් කොට, වර්ෂයක් දෙකක් පසුවී පොලී සමග විශාල මුදලක් ගන්නට බලාපොරොත්තු වෙති. එසේ කරන්නේ බැංකුවට නොව තමාට ආදරය නිසයි. යම් කිසි වැඩක් කොට පරලොවදී තමන්ට සැප බලාපොරොත්තුවීමත් මීට දෙවැනි නොවේ. 'අප මේ වැඩ කරන්නේ මෙලොව සැප තකාගෙනය'යි පිරිසිදු අදහසක් හැටියට බොහෝ දෙන නොඑක් තැන්වලදී 'පරලොව සැප බලාපොරොත්තුවීම' යන්නෙහි තේරුම නම්, ලබන ජීවිතයේදී හොඳින් කෑම්බීම්, ඉඩම් කඩම්, රථ වාහන, ගෙවල් දොරවල්, ඇඳුම් පැළඳුම් යනාදිය ලබන්නට බලාපොරොත්තු වීමයි. මේවා මෙහිදී ලබන්නට බලාපොරොත්තු වුවත් එහිදී ලබන්නට බලාපොරොත්තු වුවත් ඒ දෙකේ සැලකිය යුතු වෙනසක් නැත.

**එතකොට කර්මඵල ඇදහීමක් නැද්ද ?**

කර්මඵල ඇදහීම නම් සෑම ක්‍රියාවකටම ඊට සුදුසු ඵලයක් ඇති බැව් තේරුම් ගැනීමයි. මෙය මෙතරම් උත්තමය. මෙතරම් හීනය. මෙය මෙතරම් අවශ්‍යය. මෙතරම් අනවශ්‍යය යනාදීන් යම් කිසි ක්‍රියාවක ඇති තතු වටහා ගැනීම කර්මඵල ඇදහීමයි. එය ප්‍රඥාවයි. මෙලොව වශයෙන් වුවත් පරලොව වශයෙන් වුවත් කම් නැත. කර්මඵල ඇදහීමය කියන්නේ යම් කිසි ක්‍රියාවක ඵලයට ලොල්වීම නොවේ. ඵලයට ලොල්වී කරන වැඩය වෙළඳමකි. අසරණයකුට උදව් කිරීම යහපත් වැඩක් වුවත් එයින් තමාට වාසියක් බලාපොරොත්තුවීම පිරිසිඳු අදහසක් නොවේ.

හිඟන්නෙකුට සත පහක් දෙන්නේ තමාට පරලොව සැප බලාපොරොත්තුවෙන් නම් ඒ අදහසේ වටිනාකමක් නැත. සත පහ තමා ළඟ තිබුණට වඩා මේ දීමෙන් තමාට වාසි බැවින් එසේ කළා මිස, එය හිඟන්නා කෙරෙහි නියම කරුණාවෙන් කළ වැඩක් නොවේ. තමාගේ දෙව්ලොව ගමනට හිඟන්නා උපායක් කොට මග ඉදිකර ගත්තා මිස, හිඟන්නා කෙරෙහි නියම අනුකම්පාවක් එහි නැත. එහෙත් ඒ අසරණයන්ට දීම තමාගේ විපතට හේතු වුවත්, ඊට නොබා, නොපැකිළ, තමාට ලැබෙන විපාක ගැන කිසිත් නොසලකා, ඒ අසරණයා නෙරෙහි හුදු අනුකම්පාවෙන්, කරුණාවෙන් එය කිරීම හැබෑ උත්තම අදහසයි. එය ශ්‍රේෂ්ඨයි.

ශික්ෂාපද රැකීම පිළිබඳවද මෙසේමයි. යමෙක් සතුන් නොමරන්නේ සතුන් කෙරෙහි ඇති කරුණාව නිසා නොව තමාට සිදුවන පවට හයින් නම්, එහි උතුම් අදහසක් නැත. දිනක් මිත්‍රයකු සමඟ කතා කරමින් සිටියදී එතැන කුෂ්ට රෝගයෙන් පෙළෙන බල්ලෙක් පැමිණියේය. මගේ මිත්‍රයා මහත් පිළිකුලකින් හා නොමනාපයකින් බල්ලා දෙස රවා බලා, 'මට පවු සිදු නොවෙතොත් මම මූ මරන්මෙ'යි කීය. සැබැවින්ම ඔහු සිතින් ප්‍රාණ ඝාතය කලේය. ඔහු ශික්ෂා පදයේ අකුරු මිස සාරය නම් නොරකයි. සතුන් මැරීම තමාට පව් සිදු නොවන ක්‍රියාවක් නම් ඔහු කිසිත් පැකිළීමක් නැතිව සතුන් මරන්නේය.

එහෙත් සත්පුරුෂයෙක් නම්, සතුන් මැරීමෙන් තමාට පින් සිදු වෙතැයි කීවද හුදු කරුණාව නිසා සතුන් නොමරන්නේය. මෛත්‍රිය කරන්නේ තමාට පින් ගැනීමට නොව අනුන්ට යහපත පිණිසයි. හැම ගුණධර්මයක් සම්බන්ධයෙන්ම මෙය මෙසේ බැව් එක වරම නොවැටහුණත් ගැඹුරු ලෙස කල්පනා කිරීමේදී පැහැදිලි වෙනවා ඇත.

**එතකොට පවට භය නිසා පවින් වැළකීම වැරැද්ද ?**

නැත, නැත මේ කරුණු ඉතා කල්පනාවෙන් තේරුම්ගත යුතුයි. බොහෝ දෙනා මගේ අදහස් වරදවා තේරුම් ගැනීම ගැන මම කනගාටු වෙමි. තමාට සිදුවන පවට හයින්වත් වැරැද්දිවලින් වැළකීම ඒවා කිරීමට වඩා හැම අතින්ම අගනේය. මා කියන්නේ එහි පවිත්‍ර උසස් තත්ත්වය ගැනයි. අසරණයකුට උදව් නොකර සිටීමට වඩා මෙලොව ලාභ කීර්ති ප්‍රශංසා බලාපොරොත්තුවෙන් වුවත් උදව් කිරීම වටනේය. නොකළ යුතු බව නොවේ. මේවා පිළිබඳ පවිත්‍රත්වය අවබෝධ කර ගන්නා තුරු කොතරම් දේ කළත්, ඔහුට සත්‍යය දැක්ක නොහැක.

**එහෙත් සාමාන්‍ය කෙනෙකුට මේවා තේරුම්ගෙන කටයුතු කිරීම ඉතාම අපහසු නොවේද ?**

සැබැවින්ම එය එසේය. මේ අදහස් සාමාන්‍ය අයට නොව විශේෂ අයටයි. 'පඤ්ඤාවන්තස්සායං ධම්මො, නායං ධම්මො දුප්පඤ්ඤස්ස' 'මේ ධර්මය නුවණැතියන්ට මිස නුවණ නැතියන්ට නොවේය'යි බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. සාමාන්‍ය අයට තේරුම් ගැනීමට පහසුවන පරිදි සත්‍යය වෙනස් කළ නොහැක. සාමාන්‍ය මිනිසා විශේෂ තත්ත්වයකට පැමිණිදාට සත්‍යය වැටහෙනවා ඇත. කාටත් වැටහෙන පරිදි සත්‍යය කියන්නට යෑමෙන් බොහෝ අය අසත්‍යයක් ප්‍රකාශ කරති. සත්‍යය පවත්නා උසස් තත්ත්වයකට මිනිසා නැග එය දකිනු මිස, මිනිසා සිටින පහත් තත්ත්වයට සත්‍යය හෙළනු නොයෙදයි. එසේ කරන්නට යෑමෙන් ධර්මය නොව අධර්මයක් ඉදිරිපත් වෙයි.

**යමක් කිරීම පිරිසිඳු අදහසක් නොවෙයිද ?**

පින් ලබන අදහසින් වැඩකරන්නාගේ සිත කිලුටු වෙයි. පින කොතරම් උසස් පිරිසිදු දෙයක් වුවත් එය තමාට ලබාගන්නට ඕනෑකම ආත්මාශාවයි. තමාකරන ක්‍රියාවෙන් තමාට ලැබෙන විපාකය නොව, ඒ ක්‍රියාවේ ඇති වටිනාකම සැලකීම ශ්‍රේෂ්ඨ අදහසයි. තමාකරන වැඩය අනුන්ට යහපතක් නම් යුතුකමක්නම්, විපාකරයෙන් තමාට ලැබෙන්නේ අපායද ස්වර්ගයද, නිවනදැයි ඵලය ගැන කිසිත් නොසලකා එය කිරීම උත්තම ගතියයි. පරලොව දී ලක්ෂ ගණන් ලබන්නට බලාපොරොත්තුවෙන් මෙහිදී රුපියලක් වියදම් කිරීම මොන උතුම් අදහසක්ද ? ස්වර්ගය හෝ නිර්වාණය ලබන බලාපොරොත්තුවෙන් අසරණයකුට සැලකීම තමාගේ වාසියට වැඩකිරීමක් මිස උතුම් අදහසක් නොවේ. කවුරු වුවත් තමන්ගේ වාසියට වැඩකරති.

**මතු සම්බන්ධයි**

**VCE Chemistry 2013**

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited

**Priyantha Liyanage 0407664546**